# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2078/9 - 2018 ජූලි මස 02 වැනි සඳුදා - 2018.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : MUL/LND/02/ACQ/42.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2014/වීර්/48.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දේවාලේගම බටහිර ග්‍රාම නිලධාරි වසමට අයත් දේවාලේගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් ගේ අංක අ.ග.පි. 165, අතිරේක අංක 27, පත්‍රය 30 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි,

**කැබලි අංක 521**
ඉඩමේ නම: හෝන්පලකැටිය වත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 11 - 15ක් පමණ වයසැති පොල් ගස් 5ක් සහ අවු. 18ක් පමණ වයසැති මාර ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: තාරකා වාසලමුදලිආරච්චි සහ නිශාන්ත විතාරණ; ප්‍රමාණය: හෙක්. 0.0341.

**කැබලි අංක 522**
ඉඩමේ නම: හෝන්පලකැටිය වත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 11-17ක් පමණ වයසැති පොල් ගස් 5ක් සහ අවු. 03ක් පමණ වයසැති ඇට්ටෝනියා ගස් 2ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: තාරකා වාසලමුදලිආරච්චි සහ නිශාන්ත විතාරණ; ප්‍රමාණය: හෙක්. 0.0410.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 සැප්තැම්බර් මස 12 වැනි දින පෙ. ව. 10.00ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 සැප්තැම්බර් 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන

2018 ජුනි මස 18 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-500


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 27978 - 57 (2018/07)

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්පත් කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/ Dol/4/4/5/Yero.ES
(පැරණි අංකය: උප /3/ඉඅත්/138)
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 13/99/වී.ඊ./121.

උක්ත ශීර්ෂය යටතේ 1999.08.13 වැනි දින අංක 1092/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 08-901 යටතේ මවිසින් පළකරන ලද දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉවත් කළයුතු දිනයන් | ඉවත් කළ දින වෙනුවට ආදේශ කළයුතු දිනයන් |
|---|---|
| 1999 සැප්තැම්බර් මස 17 | 2018 අගෝස්තු මස 08 |
| 1999 අගෝස්තු මස 31 | 2018 ජූලි මස 30 |

ටී. ඒ. ඩී. ඩබ්. දයානන්ද,
ඉඩම් අත්පත් කරගැනීමේ නිලධාරි/ප්‍රාදේශීය ලේකම්,
දොළුව.

07-501

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්පත් කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : VSW/DS/LB/ACQU/PAN/POLICE
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ අංකය* :
4-3/4/2013/ඩී/421.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1996/7 හා 2016.12.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මවිසින් පළ කරන ලද 7 වන වගන්තියේ දැන්වීමේ වන්දි පරීක්ෂණ දිනය සහ වේලාව 2017.03.03 පෙ. ව. 10.00 යන්න 2018.09.19 පෙ. ව. 10.00 ලෙසත්, හිමිකම් ඉදිරිපත් කිරීමට ලබාදී ඇති දිනය 2017.02.20 යන්න 2018.09.05 යන්න ලෙසත් සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමි.

ජසෝදා උදයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
වලිකාමම් නිරිත සන්දිලිප්පායි.

2018 ජුනි මස 25 වැනි දින,
වලිකාමම් නිරිත සන්දිලිප්පායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-502

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.